# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,932/3 — 1970 නොවැම්බර් 15 වැනි ඉරිද — 1970.11.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම ආදිය

1970 අංක 376/1

අ. ආ. කා. අංක සී. 115/47

නොවැම්බර් මස 15 සහ 16 වැනි දිනයන්හි සෙනෙට් සභා කාර්‍ය සම්පාදක එල්. එම්. පී. පී. විරසිංහ මහතාට රාජකාරි කටයුතුවල යෙදීමට නුපුළු... හෙයින්, සෙනෙට් සභා කාර්‍ය සම්පාදක ධුරයෙහි වැඩ බැලීමට නියෝජ්‍ය මන්ත්‍රී මණ්ඩලයේ සහකාර ලේකම් එස්. එන්. සෙනෙවිරත්න මහතා අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත්කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්,

1970 නොවැම්බර් 14 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේ දී ය.

11—816

---

## ආණ්ඩුවේ නිවේදන

රැ.ඩී.—බී. 19/70

පිටත්. 1510.

### 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ බලසේනා) පනත

70 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ බලසේනා) පනතේ 4 වැනි හා 7 වැනි වගන්ති වලින් තමන් වෙත පැවරී ඇති බල...කාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් සාදන ලද නියෝග.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති.

...වැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග, 1970 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් (සන්නද්ධ බලසේනා) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. (1) මෙම නියෝග, 1968 ඔක්තෝබර් මස පළමුවැනි දින සිට බල පැවැත්විය යුතු අතර, එදින සිට ඒවා බලපැවැත්වුණු ලෙස සැලකිය යුතුය.
(2) පනතේ 3 (1) වැනි වගන්තියේ කාර්යයන් සඳහා නියමිත දිනය 1971 මාර්තු මස 1 වැනි ද විය යුතුයි.

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නො වුවහොත්, මෙම නියෝගවල —
" පනත " යන්නෙන් 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ සේවා) පනත අදහස් වේ.
" විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ ළමයා " යන්නෙන්—
(අ) පිරිමියකු නම් වයසින් අවුරුදු විසි එකට අඩු තැනැත්තකු; හා
(ආ) ස්ත්‍රියක් නම් වයසින් අවුරුදු විසිඑකට අඩු අවිවාහක තැනැත්තියක් අදහස් වේ.

854/3——රජ 18229—11,950 (70/11)

" හමුදාපති " යන්න—

(1) ලංකා යුධ හමුදාවේ නිලධරයකු හෝ සෙබළකු සම්බන්ධයෙහිලා ගත් කල්හි එයින් යුධ හමුදාවේ අධිපති අදහස් කෙරෙයි ;

(2) රාජකීය ලංකා නාවික හමුදාවේ නිලධරයෙකු හෝ නාවිකයෙකු සම්බන්ධයෙහිලා ගත් කල්හි, එයින් නාවික හමුදාවේ අධිපති අදහස් කෙරෙයි ; තවද,

(3) රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිලධරයකු හෝ ගුවන් භටයෙකු සම්බන්ධයෙහිලා ගත් කල්හි, එයින් රාජකීය ලංකා ගුවන් හමුදාවේ අධිපති අදහස් කෙරෙයි,

" දායක මුදල " යන්නෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගෙවනු ලබන දායක මුදලක් අදහස්වේ.

" අධ්‍යක්ෂ " යන්නෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ අදහස්වේ.

" පඩිය " යන්නෙන්—

(1) 1969 ඔක්තෝබර් මස 1 වැනි දිනට පෙරාතුව වූ යම් කාල පරිච්ඡෙදයක් සම්බන්ධයෙන් වූ විට, දායකයාගේ නිත්‍ය තනතුරෙහි හෝ තාවකාලික තනතුරෙහි හෝ මූලික පඩියෙන්, වඩා වැඩි පඩිය අදහස් වන නමුත්, දායකයා විසින් ලැබිය හැකි හෝ, භුක්ති විඳිය හැකි යම් දීමනා හෝ වෙනත් වේතන හෝ අනියම් ප්‍රතිලාභවල වටිනාකම හෝ ඊට ඇතුළත් නොවේ ; තවද

(2) 1969 සැප්තැම්බර් 30 වැනි දිනට පසුව යෙදෙන යම් කාල පරිච්ඡෙදයක් සම්බන්ධයෙන් වූ විට, තම නිත්‍ය තනතුරෙහි හෝ තාවකාලික තනතුරෙහි 1969 සැප්තැම්බර් 30 වැනි දින ලැබූ වැටුප මත දායකයා විසින් ලබා ගත හැකි වූ කල්පිත මූලික පඩියෙන් වඩා වැඩි පඩිය අදහස් වන නමුත් 1969 සැප්තැම්බර් මස 30 වැනි දින දායකයා විසින් ලැබිය හැකි හෝ භුක්ති විඳිය හැකි යම් දීමනා හෝ වෙනත් වේතන හෝ අනියම් ප්‍රතිලාභවල වටිනාකම හෝ ඊට ඇතුළත් නොවේ.

" ගණන් ගත හැකි සේවය " යන්න—

(1) යුද්ධ හමුදාවේ නිලධරයකු හෝ සොල්දාදුවකු සම්බන්ධයෙන් වූ විට, යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත්, එකී සංග්‍රහයේ 6 වැනි හා 25 වැනි නියෝග යටතේ ගණන් ගත හැකි දස වර්ෂ බෝනස් සේවා කාල එකතුව ඊට ඇතුළත් නොවේ ;

(2) රාජකීය ලංකා නාවික හමුදාවේ යම් නිලධරයෙකු හෝ නාවිකයෙකු සම්බන්ධයෙන් වූ විට, නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත්, එකී සංග්‍රහයේ 6 වැනි හා 23 වැනි නියෝග යටතේ ගණන් ගත හැකි දසවර්ෂ බෝනස් සේවා කාල එකතුව ඊට ඇතුළත් නොවේ ;

(3) රාජකීය ලංකා ගුවන් හමුදාවේ යම් නිලධරයෙකු හෝ ගුවන් නැවියෙකු සම්බන්ධයෙන් වූ විට, ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත්, ඒ සංග්‍රහයේ 5 වැනි හා 23 වැනි නියෝග යටතේ ගණන් ගත හැකි දස වර්ෂ බෝනස් සේවා කාල එකතුව ඊට ඇතුළත් නොවේ.

" සේවා විශ්‍රාම වැටුප " යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය, නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය හෝ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ යම් තැනැත්තෙකුගේ ගණන් ගත හැකි සේවය සම්බන්ධයෙන් ඔහුට ප්‍රදානය කෙරෙන විශ්‍රාම වැටුප් අදහස් වේ.

4. මෙහි මින් මතු විධිවිධාන සැලැස්වෙන පරිදි වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකව ඇති, නොහොත්, දායක වී ඇති සන්නද්ධ බලසේනාවල නැයිගිය සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට හා අනාථ දරුවන්ට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා ඒ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ඇති කළ යුතුය.

5. මේ නියෝග යටතේ, මියගිය දායකයකුගේ වැන්දඹුවකට හෝ දරුවකුට හෝ දරුවන්ට ගෙවිය යුතු කිසිම විශ්‍රාම වැටුපක්, (241 වැනි අධිකාරය වන) මුදල් බදු ආඥාපනත යටතේ මුදල් බදු ගෙවීමට යටත් නොවිය යුතුය.

6. පනතේ 5 (1) වැනි වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තෝරා ගන්නා හෝ තෝරාගන්නා ලදැයි සලකනු ලබන සෑම තැනැත්තකු 1968 ඔක්තෝබර් මස පළමු වැනි දින සිට විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු බවට පත්වූ ලෙස සැලකිය යුතුය.

7. පනතේ 3 (2) වැනි වගන්තියේ සඳහන් කවර හෝ තැනැත්තකු, සන්නද්ධ බල සේනාවන්හි සාමාජිකයකු බවට පත්වන දිනයේ සිට විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයකු බවට පත් විය යුතුය.

8. සෑම දායකයකුගේ ද, මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇතිවිය හැකිවන සෑම දායකයකුගේම බිරිඳකගේ සහ දරුවකුගේ උපන් දිනය හා සෑම දායකයකු විසින් ගෙවන ලද දායක මුදල් පිළිබඳ සියළු විස්තර ද මෙම නියෝගවල කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වන දායකයින්ගේ සහ ඔවුන්ගේ පවුල් වලට අයත් අයගේත් වෙනත් විස්තර ද ඇතුළත් වන ලේඛනයක් පවත්වාගෙන යාමට හමුදාපති විසින් කටයුතු සැලැස්විය යුතුය.

9. සෑම දායකයකු විසින්ම, මෙම නියෝග ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වන දින සිට මාස තුනක් ඇතුළතදී හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ඔහු දායකයකු වන දින සිට මාස තුනක් ඇතුළතදී හෝ යන මින් කුමක් පසුව වන්නේද, ඊට පෙර, පහත සඳහන් විස්තර දක්වෙන ප්‍රකාශනයක් ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත සැපයිය යුතුය :—

(අ) ඔහුගේ සම්පූර්ණ නම, නිලය හෝ තත්වය, රෙජිමේන්තු අංකය හා ඒකකය ;

(ආ) ඔහුගේ උපන් දිනය ;

(ඇ) විශ්‍රාම වැටුප් ක්‍රමයට ඔහු දායකයකු වන දිනය ;

(ඈ) ඔහු විවාහක නම්, විවාහ වූ දිනයද, ඔහුගේ බිරිඳගේ සම්පූර්ණ කන්‍යා නාමය හා ඇගේ උපන් දිනය ; සහ

(ඉ) ඔහුට දරුවන් කිසිවකු සිටින් නම්, ඒ එක් එක් දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය සහ උපන් දිනය.

10. දායකයකු වශයෙන් සිටින අතර විවාහ වන සෑම දායකයකු විසින්ම, ඔහු විවාහ වූ දින සිට තුන් මාසයක් ඇතුළත දී පහත සඳහන් විස්තර ප්‍රකාශයක් ඒ කාර්යය සඳහා වූ ආකෘතිපත්‍රය මගින් හමුදාපති වෙත සැපයිය යුතුය :—

(අ) ඔහු විවාහ වූ දිනය ;

(ආ) ඔහුගේ බිරිඳගේ සම්පූර්ණ කන්‍යා නාමය හා ඇගේ උපන් දිනය ;

(ඇ) ඔහුගේ විවාහයට කලින් ඔහු නිසා ඔහුගේ බිරිඳට උපන් දරුවන් කිසිවකු සිටින් නම්, එබඳු එක් එක් දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය හා උපන් දිනය.

11. සෑම දායකයකු විසින්ම—

(අ) ඔහුගේ බිරිඳට දරුවකු උපන් විට, එම උපත වූ දින සිට මාස තුනක් ඇතුළත දී එම දරුවාගේ සම්පූර්ණ නමද, උපන් දිනය සහ ස්ත්‍රී පුරුෂ භාවයද, ඒ සඳහා නියමිත ආකෘතිපත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය.

(ආ) වයසින් අවුරුදු විසිඑකකට අඩුවන ගැහැණු දරුවකු විවාහ වූ විට, එම විවාහය සිදුවූ දින සිට මාස තුනක් ඇතුළතදී, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් එම දරුවාගේ සම්පූර්ණ නම එම විවාහය සිදුවූ දිනය හා දරුවාගේ ස්ත්‍රී පුරුෂ භාවය හමුදාපති වෙත දැනුම් දිය යුතුය.

(ඇ) ඔහුගේ බිරිඳගේ හෝ විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවකුගේ හෝ මරණය සිදුවූ විට, එම මරණය සිදුවී මාස තුනක් ඇතුළත දී බිරිඳගේ හෝ දරුවාගේ හෝ සම්පූර්ණ නම හා මරණය සිදුවූ දිනය, ඒ සඳහා නියමිත ආකෘතිපත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය ; තවද

(ඈ) බලය ඇති අධිකරණයක තීන්දුවක් මගින් ඔහුගේ විවාහය නිෂ්ප්‍රභා කර එසේ නැතහොත් අවලංගු කර ඇත්නම්, එම නිෂ්ප්‍රභා කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ දින සිට මාස තුනක් ඇතුළත දී ඔහුගේ බිරිඳගේ සම්පූර්ණ නම සහ එම නිෂ්ප්‍රභා කිරීමේ හෝ අවලංගු කිරීමේ දිනය, ඒ සඳහා නියමිත ආකෘතිපත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය.

12. (1) දයකයකුගේ වැන්දඹුව විසින්:—

(අ) එම දයකයාගේ මරණය සිදුවූ විට, එම මරණය සිදුවූ දින සිට මාස තුනක් ඇතුළතදී, ඔහුගේ මරණය සිදුවූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය ;

(ආ) එම දයකයා නිසා ඔහුගේ මරණින් පසු ඇය ලබන යම් දරුවෙක් වේනම්, එම දරුවාගේ උපතවූ දින සිට මාස තුනක් ඇතුළතදී, එම දරුවාගේ සම්පූර්ණ නම, උපන් දිනය හා ස්ත්‍රී පුරුෂ භාවය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය ;

(ඇ) වයසින් අවුරුදු විසි එකකට අඩුවෙන් සිටියදී, එම දයකයාගේ යම් ගැහැණු දරුවකු විවාහවූ විට, එම විවාහය සිදුවී මාස තුනක් ඇතුළතදී, එම දරුවාගේ සම්පූර්ණ නම හා ඇය විවාහවූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය ;

(ඈ) එම දයකයාගේ යම් කිසි දරුවකු විශ්‍රාම වැටුපක් ලැබිය හැකි වයසේ සිටියදී මරණයට පත්වූවහොත්, එම මරණය සිදුවූ දින සිට මාස තුනක් ඇතුළතදී එම දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය හා මරණය වූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය ; සහ

(ඉ) ඇයගේම නැවත විවාහයක් සිදුවූවහොත්, එම නැවත විවාහය සිදුවූ දින සිට මාස තුනක් ඇතුළතදී එම නැවත විවාහය සිදුවූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දිය යුතුය.

(2) මෙම නියෝගයේ (1) (අ) ඡේදය යටතේ කිසියම් දයකයකුගේ වැන්දඹුව විසින් කළ යුතු දැනුම් දීම සඳහා දයකයාගේ ඇවෑමෙන් වැන්දඹුවක් නොසිටිය හොත්, දයකයාගේ ළඟම ඥාතිවරයා විසින් එම දැනුම්දීම කළ යුතුය.

(3) මෙම නියෝගයේ (1) (ආ) සහ 1 (ඇ) ඡේද යටතේ වැන්දඹුව විසින් කළ යුතුව ඇති දැනුම්දීම සඳහා, එවැනි දරුවකුගේ විවාහය හෝ මරණය සිදුවන අවස්ථාවේ වැන්දඹුව ජීවත්ව නොසිටියහොත් අවස්ථාවෝචිත පරිදි, එම දරුවාගේ විවාහය හෝ මරණය සිදුවීමට පෙරාතුවම එම දරුවාගේ භාරකරු වශයෙන් සිටි තැනැත්තා විසින් එම දැනුම්දීම කළ යුතුය.

13. මෙම නියෝග යටතේ ප්‍රකාශණයක් හෝ දැනුම් දීමක් කරන සෑම දයකයකුම හෝ අන් තැනැත්තකු විසින් එම ප්‍රකාශයෙහි හෝ දැනුම් දීමෙහි අඩංගු කරුණු සනාථ කිරීම සඳහා හමුදාපති විසින් නියම කළ හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

14. මෙම නියෝගයන් යටතේ හෝ හමුදාපති විසින් නියම කරන පරිදි හෝ සැපයිය යුතුව ඇති දැනුම් දීම හා වෙනත් විස්තර හමුදාපති වෙත සැපයිය යුත්තේ—

(අ) සේවයේ යෙදී සිටින දයකයෙකු විසින් නම් අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ ඒකකයේ, නැවේ හෝ ස්ථානයේ අණදෙන නිලධාරී මගින් ;

(ආ) අන් යම් තැනැත්තකු විසින් නම්, කෙළින්ම හමුදාපති වෙතය.

15. 9, 10, 11, 12, 13 සහ 14 වැනි නියෝගවල විධිවිධාන එක් බිරිඳක් ඇති දයකයකු හට අදාළ වන පරිදිම බිරින්දෑන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් ඇති දයකයකු සම්බන්ධයෙන්ද අදාළ විය යුතුය.

16. (1) සෑම දයකයකුම විසින් ඔහුගේ වැටුපෙන් සියයට හතර බැගින් දයක මුදල් විශ්‍රාම වැටුපට ගෙවිය යුතුය.

(2) මෙම නියෝගය යටතේ ගෙවිය යුතු දයක මුදල් දිනපතා එකතු විය යුතු අතර දයකයාගේ වැටුපෙන් එය මාස්පතා අඩුකර ගත යුතුය.

(3) දයකයකු හට කිසියම් මසකදී සම්පූර්ණ වැටුපට හිමිකමක් ඇති නොවන විට, ඔහුගෙන් දයක මුදල් අයකර ගත යුත්තේ ඔහු නියම වශයෙන් ලබන වැටුප මතවේ. යම් මසකදී ඔහුට කිසිදු වැටුපක් අහිමි වුවහොත් ඒ මාසය සඳහා ඔහුගෙන් දයක මුදල් අයකර නොගත යුතුය.

(4) විශ්‍රාම වැටුප් සඳහා දයක මුදල් අඩුකර ගැනීම දයකයකුගේ වැටුපෙන් පළමුවෙන්ම කෙරෙන අය කිරීමක් විය යුතුය.

(5) [illegible]

17. (1) [illegible] ඇති සෑම දයකයකු විසින්, ඔහුගේ කැමැත්ත පරිදි, මෙහි මීට පසුව දක්වා ඇති අන්දමට, එම සේවය සම්බන්ධයෙන් අදාළ දයක මුදල් ඊට අයත් පොළියත් සමග ගෙවිය හැකිය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් පරිදි සමා දයකයකු වන දිනට කලින් කළාවූ ගණන් ගත හැකි සේවයේ එක් එක් සම්පූර්ණ කළ මාසය සඳහා දයකයකු විසින් ගෙවිය යුතු දයක මුදල විය යුත්තේ, මෙහි (3) වන ඡේදයේ (අ) සහ (ආ) අනුඡේදයන්හි සඳහන් දයක මුදල්වල එකතුව, එසේ ගණන් ගත හැකි සේවා කාලය තුළ ඇති සම්පූර්ණ කළ මාස ගණනින් බෙදූ විට ප්‍රමාණය වේ.

(3) සමා දයකයකු වන දිනට කලින් කළාවූ ගණන් ගත හැකි සේවය සඳහා දයකයකු විසින් ගෙවිය යුතු දයක මුදල් පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතුය :—

(අ) 1969 ඔක්තෝබර් 1 වෙනි දිනට පෙර, යුධ හමුදාවට අයත් නිත්‍ය බලසේනාවේ, රාජකීය ලංකා නාවික හමුදාවට අයත් නිත්‍ය නාවික බලසේනාවේ හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවට අයත් නිත්‍ය ගුවන් බලසේනාවේ කළ ගණන් ගත හැකි යම් සේවා කාලයක් හෝ සේවාකාල සඳහා ගෙවිය යුතු දයක මුදල් විය යුත්තේ, එම සම්පූර්ණ සේවා කාලය සඳහා දයකයා ලැබූ වැටුපේ එකතුවෙන් අවුරුද්දකට සියයට හතරකි.

(ආ) ඔහු දයකයකු වන දිනට කලින් ලත්, මෙම ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් වන ගණන් ගත හැකි සේවය හැරුණු විට වෙනත් ගණන් ගත හැකි සේවා කාලයක් හෝ කාල ඇත්නම්, ඒ සඳහා දයක මුදල් අයකරන ප්‍රමාණය විය යුත්තේ, තත් සේවයේ එක් එක් සම්පූර්ණකළ මාසය සඳහා, අදාළ පරිදි, යුධ හමුදාවේ නිත්‍ය බලසේනාවට හෝ රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික හමුදාවට හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය ගුවන් බල සේනාවට හෝ දයකයා බැඳුන දිනයේදී ලබමින් සිටි මාසික වැටුපෙන් සියයට හතර බැගින්ය.

(4) මෙම නියෝගයන්හි (3) වන ඡේදයේ (අ) සහ (ආ) යන අනුඡේදවල සඳහන් දයක මුදල් සඳහා අවුරුද්දකට සියයට හතර බැගින් වන වැල් පොළියක්, 1968 ඔක්තෝබර් පළමුවෙනි දින හෝ ඔහු දයකයකු බවට පත් වන දින හෝ යන මින් කවර දිනයක් පසුව වන්නේද එදින සිට, එම දයක මුදල් ගෙවන දිනය වන තෙක් දයකයා විසින් ගෙවිය යුතුය.

එසේ වුවද, දයකයා හට ඔහුගේ සේවා විශ්‍රාම වැටුප වෙනුවෙන් ලබන හැකි පරිවර්තිත පාරිතෝෂිකයෙන් දයකයා විසින් එම දයක මුදල් ගෙවන අවස්ථාවකදී වැල් පොළිය ගණන් බැලිය යුත්තේ, ඔහු විශ්‍රාම ගන්නා දිනයද ඇතුළුව එදින දක්වා පමණකි.

(5) මෙම නියෝගයේ (3) වන හා (4) වන ඡේදයන්හි සඳහන් වන දයක මුදල් හා පොළිය, මෙම නියෝගයන්හි ඊට පටහැනි වන කිසිවක් නොසළකා, මෙහි පහත දක්වෙන පරිදි දයකයා විසින් ගෙවිය යුතුය :—

(අ) යන්ත්‍රගත බලසේනාවන්හි සාමාජිකයකු වශයෙන් ඔහුගේ සේවා කාලය තුළ යම් අවස්ථාවකදී හෝ ඊට පසුව හෝ මුළු මුදල වශයෙන් එක් වරකදී, හෝ

(ආ) එක් කොටසක් ඔහුගේ සේවා විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවන පරිවර්තිත පාරිතෝෂිකයෙන් ද, ඉතිරිය, ඔහු යන්ත්‍රගත බලසේනාවන්හි සාමාජිකයකුව සිටීම නිම කළ දිනයේදී දයක මුදල් අඩුකර ගන්නා ලද මාසික ප්‍රමාණයට සමාන මාසික කොටස් මුදල් වශයෙන් හෝ දයකයා හා අධ්‍යක්ෂ එකඟ වන ඊට වැඩි යම් ප්‍රමාණයක මාසික කොටස් මුදල් වශයෙනි.

(6) මෙම නියෝගයේ (5) වන ඡේදයේ (ආ) අනුඡේදයෙහි දක්වා ඇති පරිදි දයකයෙකු එසේ දයකයකු වන දිනට කලින් ලබා ඇති ඔහුගේ ගණන් ගත හැකි සේවය සම්බන්ධයෙන් දයක මුදල් සහ පොළිය ගෙවන විට—

(අ) ඔහුගේ සේවා විශ්‍රාම වැටුපෙන් එම ගෙවීම කිරීම නතර කිරීමට ඔහු අදහස් කරන්නේ නම් ඒ බව, ඉතිරි දයක මුදල් හා පොළිය ගෙවා අවසන් කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාපති වෙත දැනුම් දීම ඔහුට කළ හැක. එම දැනුම් දීම හමුදාපති වෙත ලැබුණු විට, එම දැනුම්දීම කළ මාසයට පසුව එන මාසයේ සිට, දයකයාගේ සේවා විශ්‍රාම වැටුපෙන් දයක මුදල් සහ පොළිය අයකර ගැනීම හමුදාපති විසින් නතර කළ යුතුය.

(ආ) දයකයකු ඉතුරු දයක මුදල හා පොළිය ගෙවා අවසන් කිරීමට පෙර යම් දිනෙක විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවන් නොමැතිව වැන්දඹු තැනැත්තකු වුවහොත්, ඔහු එසේ වැන්දඹු තැනැත්තකු වූ දින සිට ඔහුගේ සේවා විශ්‍රාම වැටුපෙන් දයක මුදල් සහ පොළිය අයකර ගැනීම නතර කළ යුතුය.

(7) දයකයකු, එසේ දයකයකු වූ දිනට කලින් කළාවූ පූර්ව සේවය සඳහා දයක මුදල් ගෙවා ඇති අවස්ථාවකදී හෝ ඉන් කොටසක් පමණක් ගෙවා ඇති අවස්ථාවකදී හෝ, අධ්‍යක්ෂ විසින් තම අභිමතය පරිදි තීරණය කරන අන්දමකට, අදාළ වන අයුරු එම දයක මුදල් හා පොළිය සම්පූර්ණ වශයෙන් හෝ ගෙවා නොමැති එහි ඉතිරි කොටස හෝ ගෙවීම එබඳු දයකයකුගේ වැන්දඹුව විසින් කළ හැකිය.

(8) පහත් 3 වැනි වගන්තියට අනුව විශ්‍රාම වැටුප් ක්‍රමයට දයකයකුවීමට තෝරා ගනු ලැබ ඇතැයි සළකනු ලබන සන්නද්ධ බල සේවාවන්හි සාමාජිකයකු පිළිබඳව වන විට, ඔහු දයකයකු බවට පත් වී ඇතැයි සලකනු ලබන දිනට කලින් ලත් පූර්ව සේවා කාලය සම්බන්ධයෙන් වන දයක මුදල් හා පොලිය අධ්‍යක්ෂක විසින් තීරණය කරන අන්දමකට එබඳු දයකයෙකුගේ වැන්දඹුව විසින් ගෙවිය හැකිය.

18. දයකයකු—

(අ) විශ්‍රාම ගැනීම, ඉ:ක්කිරීම, ඉල්ලා අස්වීම, පහකිරීම හෝ සේවයෙන් ඉවත්වීමක් කරණ කොට ගෙන සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකු වීම නැවතුන කල්හි, හෝ

(ආ) මියගිය කල්හි

යන සිදුවීම වලින් පළමුවෙන් ඇතිවන සිඩියෙදී ඔහුගේ දයක මුදල් ඔහුගේ වැටුපෙන් අයකර ගැනීම නැවැත්විය යුතුය.

19. දයකයා විසින් ගෙවනු ලැබූ දයක මුදල් සියල්ල සහ ඊට අයවූ පොලිය ද ලංකාවේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

20. (1) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකු වශයෙන් (සේවයෙහි යෙදී සිටියදී මියයන) හෝ දුබලතා හේතුන් මත එම සේවයෙන් අස්කරනු ලැබීමෙන් පසු හෝ යම්කිසි හේතුවක් කරණ කොට ගෙන විශ්‍රාම වැටුප් මත විශ්‍රාම ගැනීමෙන් පසු, දයකයකු සම්බන්ධයෙන් ගෙවිය හැකි විශ්‍රාම වැටුප් ප්‍රමාණය (3) වන නියෝගයෙහි විධානයන්ට යටත්ව, මෙහි පහත දක්වෙන පරිදි විය යුතුය :—

(අ) අවස්ථාවෝචිත පරිදි, සේවයේ යෙදී සිටියදී ඔහුගේ මියයෑම හෝ දුබලතා හේතුන් මත එම සේවයෙන් අස්කිරීම හෝ එම සේවයෙන් විශ්‍රාම ගැනීම හෝ සිදුවූ විට ඔහුගේ ගණන් ගතහැකි සේවා කාලය අවුරුදු විසි පහක් හෝ ඊට අඩුවේනම්, විශ්‍රාම වැටුප ඔහුගේ අවසාන වැටුපෙන් සියයට විසිපහක් විය යුතුය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, සේවයේ යෙදී සිටියදී ඔහුගේ මිය යෑම හෝ දුබලතා හේතුන් මත එම සේවයෙන් අස්කිරීම හෝ එම සේවයෙන් විශ්‍රාම ගැනීම හෝ සිදුවන විට ඔහුගේ ගණන් ගත හැකි සේවා කාලය අවුරුදු විසිපහකට අඩු නොවේනම්, මෙම ඡේදයේ (අ) උප ඡේදය ප්‍රකාරවන විශ්‍රාම වැටුප, එම ගණන් ගත හැකි සේවයේ අවුරුදු විසිපහකට වැඩිවන සම්පූර්ණ කරන ලද සෑම එක් එක් අවුරුද්දක් සඳහා ඔහුගේ අවසාන වැටුපෙන් සියයට හයෙන් පහ බැගින් එම ගණන් ගත හැකි සේවයේ අමතර අවුරුදු දහයක උපරිමය දක්වා වැඩි විය යුතුය.

(2) සන්නද්ධ බල සේවාවන්හි සාමාජිකයකු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දයකයකුවන දිනට පෙර කරන ලද ගණන් ගතහැකි සේවය වෙනුවෙන් දයක මුදල් ගෙවනු නොලැබූ කල්හි මෙම නියෝගයේ (1) ඡේදයේ (අ) හෝ (ආ) උපඡේදය ප්‍රකාර විශ්‍රාම වැටුප, අවස්ථාවෝචිත පරිදි, දයක මුදල් ගෙවා නොමැති එම ගණන් ගත හැකි සේවයේ සම්පූර්ණ කරන ලද එක් එක් අවුරුද්ද සඳහා 1/60 බැගින්ද, අවුරුද්දකට අඩු සම්පූර්ණ කරන ලද එක් එක් මාසය සඳහා 1/600 බැගින්ද අඩුකළ යුතුයි.

(3) මෙම නියෝගයෙහි " අවසාන වැටුප " යන්නෙන්—

(අ) සන්නද්ධ සේවාවන්හි සාමාජිකයකු ලෙස සේවයේ යෙදී සිටින අතර මියයන දයකයකු සම්බන්ධයෙන් වන විට එවැනි දයකයකු මියයන අවස්ථාවෙහි ඔහුට හිමිවූ වැටුප අදහස් කෙරෙන අතර,

(ආ) දුබලතා හේතුන් මත අස් කිරීමෙන් පසු හෝ විශ්‍රාම ගැනීමෙන් පසු හෝ මියයන දයකයෙකු සම්බන්ධයෙන් වන විට එවැනි දයකයකු විශ්‍රාම ගනු ලැබූ අවස්ථාවෙහි ඔහුට හිමිවූ වැටුප අදහස් කෙරේ.

(4) මෙම නියෝග යටතේ ගෙවිය යුතු සෑම විශ්‍රාම වැටුපක්ම ගෙවීම, එම විශ්‍රාම වැටුප ගෙවිය යුතුවූ දයකයාගේ මරණය සිදුවූ දිනට පසු දින සිට ආරම්භ විය යුතු අතර, එය දිනපතා එකතු විය යුතු අතර මාස්පතා ගෙවිය යුතුය.

21. මෙම නියෝගයන්හි වෙන අයුරකින් විශේෂයෙන් විධිවිධාන සලසා ලද අවස්ථාවන්හි හැර දයකයෙකුගේ අර්ථලාභීන් විය යුත්තේ—

(අ) ඔහුගේ වැන්දඹුව ; සහ

(ආ) මිය ගොස් ඇති හෝ මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපට හිමිකම නොමැති යම් කිසි බිරිඳක් සමග ඔහු විවාහ වීමෙන් ලැබූ විශ්‍රාම වැටුප් ලැබිය යුතු වයසේ පසුවෙන්නාවූ දරුවා හෝ දරුවන්ය.

එසේ වුවද, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එක විවාහයකින් ලත් දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් එක අර්ථලාභියකු වශයෙන් සැලකිය යුතුය.

22. දයකයකුගේ වැන්දඹුව, 23 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව, 20 වැනි නියෝගයට අනුකූලව ගණන් බලන ලද විශ්‍රාම වැටුපකට හිමිකම් ඇතිවිය යුතුය.

23. දයකයකුගේ වැන්දඹුව නැවත විවාහ වුවහොත් එසේ ඇය නැවත විවාහවූ දින සිට මෙම නියෝග යටතේ කිසිම විශ්‍රාම වැටුපක් ඇයට නොලැබිය යුතුය.

24. (1) 23 වැනි නියෝගයේ විධිවිධාන ප්‍රකාර වැන්දඹුවකට විශ්‍රාම වැටුප් ගෙවීම නතර කරන කල්හි හෝ විශ්‍රාම වැටුපක් හිමි වැන්දඹුවක් මියයන කල්හි—

(අ) වැන්දඹුවට දයකයා සමග වූ විවාහයෙන් ඉපදුන විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ යම්කිසි දරුවකු හෝ දරුවන් සිටිත්නම්, ඇයට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප, අවස්ථාවෝචිත පරිදි, එවැනි දරුවා හෝ දරුවන් අතර සම කොටස් වශයෙන් ගෙවිය යුතුය ; නැතහොත්

(ආ) වැන්දඹුවට එවැනි දරුවකු හෝ දරුවන් නොමැති විටකදී, කලින් විවාහයකින් ලත් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසු දරුවන් සිටිත් නම්, එම විශ්‍රාම වැටුප සම කොටස් වශයෙන් ඔවුන්ට ගෙවිය යුතුය. එවැනි දරුවන් ද නොමැති නම් විශ්‍රාම වැටුප අවලංගු විය යුතුය.

(2) යම් විවාහයකින් දයකයකුගේ එක දරුවකු පමණක් සිටින කල හා එම දරුවාට මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් හිමිවන කල, එවැනි දරුවාගේ විශ්‍රාම වැටුප විය යුත්තේ ඒ දරුවාගේ මෑණියන්ට ලැබුන හෝ ඇයට ගෙවිය යුතු වූවානම් ඇයට ලැබෙන්නට තිබුන විශ්‍රාම වැටුප් ප්‍රමාණයම වන අතර, ඒ දරුවා විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මයාම හෝ ඒ දරුවා මියයාම යන සිධීන් දෙකින් කලින් සිදුවන සිඩියේදී එම විශ්‍රාම වැටුප අවලංගු විය යුතුය.

(3) දයකයෙකුගේ එකම විවාහයකින් ලත් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි දරුවන් ගණනක් සිටින කල ඔවුන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප විය යුත්තේ ඔවුන්ගේ මෑණියන්ට ලැබුන හෝ ඇයට ගෙවිය යුතු වූවානම් ඇයට ලැබෙන්නට තිබුන විශ්‍රාම වැටුප් ප්‍රමාණයම වන අතර, විශ්‍රාම වැටුප සම කොටස් වශයෙන් එම දරුවන් අතර බෙදා දිය යුතුය. එම දරුවන් ගෙන් යම් කිසිවකු විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මවන කල හෝ මියයන කල, ඒ දරුවාගේ එම විශ්‍රාම වැටුප් කොටස එම විවාහයෙන් ලත් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇති ජීවත්ව සිටින දරුවා හෝ දරුවන් වෙත, අවස්ථාවෝචිත පරිදි, සම කොටස්වලින් ගෙවිය යුතුය.

25. කලින් විවාහයකින් ලත් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් සහ වැන්දඹුවක් සිටියදී දයකයකු මියයන කල, 20 වැනි නියෝගය ප්‍රකාර ගණන් ගන්නා ලද විශ්‍රාම වැටුපෙන් එක භාගයක් වැන්දඹුවට හිමිවිය යුතු අතර, විශ්‍රාම වැටුපේ අනික් භාගය සම කොටස්වලින්, කලින් සිදුවූ විවාහයෙන් ලත් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන්ට හිමිවිය යුතුය. වැන්දඹුව නැවත විවාහ වුවහොත් හෝ දයකයා සමග වූ විවාහයෙන් විශ්‍රාම ලැබිය හැකි වයසේ දරුවන් නොමැතිව මියගිය හොත්, ඇයට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණය, දයකයාගේ කලින් සිදුවූ විවාහයේ, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන් අතර සම කොටස්වලින් බෙදිය යුතුය. දයකයා සමග වූ විවාහයෙන් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් ඇතිව වැන්දඹුව මියගියා නම්, ඇයට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණය, එවැනි දරුවන් අතර සම කොටස්වලින් බෙදිය යුතුය. කලින් සිදුවූ විවාහයේ විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන් අතුරෙන් ඉතා වැඩි බාලයා, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මවන කල විශ්‍රාම වැටුපෙන් එම දරුවාට ගෙවිය යුතුව තිබුන ප්‍රමාණය වැන්දඹුවට ගෙවිය යුතුය.

26. දයකයා විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවීම නැවැත්වීමෙන් පසු ඔහු සමග කළ විවාහයකින් ජනිතවන වැන්දඹුවකට හා එවැනි විවාහයකින් ඇතිවන දරුවකුට මෙම නියෝග යටතේ කිසිම විශ්‍රාම වැටුපක් හිමිවිය යුත්තේ හෝ හිමිවන්නේද නැත.

27. (1) මෙහි මින්මතු සලස්වන විධිවිධාන පරිදි හැර, දායකයකු විවාහවීමෙන් දෙදෙනකු ඇතුළත ඔහු මියයන කල සහ එවැනි විවාහයකින් දරුවන් නොමැති කල, මෙම නියෝග යටතේ ඔහුගේ වැන්දඹුව, විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා අර්ථලාභිකාවක් හෝ විශ්‍රාම වැටුපකට හිමිකාරියක් හෝ නොවිය යුතුය. — එසේ වුවද, මෙම ඡේදයේ මීට පෙරාතුව දක්වා ඇති විධිවිධාන නොතිබෙන්නට වැන්දඹුවට හිමිකම ඇති විය හැකිව තිබූ සම්පූර්ණ විශ්‍රාම වැටුප හෝ ඉන් මොනයම් කොටසක් හෝ ඇයට ගෙවන ලෙස අධ්‍යක්ෂ විසින් තම අභිමතය පරිදි විධානය කළ හැකි වන අතර, ඒ අන්දමට අධ්‍යක්ෂ විධානය කරන කල්හි, වැන්දඹුව ඒ අනුව ගෙවීම ලැබීමට හිමි කාරියක් වන අතර මෙම නියෝගයන්හි කාර්යයන් සඳහා අර්ථලාභිකාවක්ද වන ලෙස සැලකිය යුතුයි.

(2) මෙම නියෝගයේ (1) වැනි ඡේදයට අනුකූලව අධ්‍යක්ෂ විසින් දෙනු ලැබූ විධානයක් බලය ඇතිව විශ්‍රාම වැටුපෙන් කොටසක් පමණක් වැන්දඹුවට ගෙවිය යුතු අතර, එම විශ්‍රාම වැටුපේ ඉතිරි කොටස එක අර්ථලාභයකු සිටිනම් ඔහුට හෝ අර්ථලාභීන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින්නම්, සම කොටස් වලින් එම අර්ථලාභීන්ට හෝ ගෙවිය යුතුය.

28. බිරින්දෑන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින දායකයකු කෙරෙහි මෙම නියෝග අදාළවීම මෙහි පහත දක්වා ඇති විධිවිධාන වලට යටත්ව විය යුතුය:

(1) මෙම නියෝග වල කාර්යයන් සඳහා එබඳු දායකයකුගේ දැනට පවතින විවාහවලින්, කාලය අනුව ප්‍රථමයෙන් බැඳුනු විවාහය පමණක් නීත්‍යානුකූල විවාහය ලෙස සැලකිය යුතුය.

එසේ වුවද, කලින් බැඳුන විවාහයක් දික්කසාදයකින් නිෂ්ප්‍රභාකර තිබීම හේතුව කරනකොට ගෙන පමණක් එබඳු දායකයකුගේ දැනට පවත්නා විවාහ අතරින් කාලය අනුව ප්‍රථමයෙන් බැඳුනා යයි සැලකෙන විවාහය එසේ යැයි වලංගු වනුයේ එම දික්කසාදය මෙම නියෝගයේ (2) වන ඡේදය යටතේ වලංගු වන දික්කසාදයක් ලෙස සැලකිය හැකි වන්නේ නම් පමණය.

(2) දායකයකුගේ යම් විවාහයක් නිෂ්ප්‍රභා කෙරෙන දික්කසාදයක්, මෙම නියෝගවල කාර්යයන් සඳහා වලංගු දික්කසාදය ලෙස සලකනු ලබන්නේ මොන අවස්ථාවකදී හෝ එම දික්කසාදයට කලින් දායකයාගේ වෙනත් විවාහයක් අවලංගු කෙරෙන දික්කසාදයක් නොවූයේ නම් පමණයි.

(3) මෙම නියෝග යටතේ පහත දක්වා ඇති අයට කිසිම විශ්‍රාම වැටුපක් නොගෙවිය යුතුය.

(අ) මෙම නියෝගයේ (1) වැනි ඡේදයෙන් අදහස් කරන පරිදි, නීත්‍යානුකූල විවාහයක් යැයි සැළකිය නොහැකි විවාහයකට දායකයාගේ ජීවිත කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔහු හා ඇතුළත්වූ බිරිඳකට; හෝ

(ආ) යම්කිසි දරුවකු උපදින අවස්ථාවේදී එම උපතට තුඩුදුන් විවාහය ඉහතින් කියවෙන පරිදි නීත්‍යානුකූල විවාහයකැයි සැළකිය නොහැකිවන විට දායකයාගේ එබඳු විවාහයකින් උපදින දරුවකුට.

29. (1) වැන්දඹුවකට ගෙවිය යුතුවූ විශ්‍රාම වැටුප් වැන්දඹුව සිහිවිකල්ව සිටින නම් [illegible] පුද්ගලයකු හට අධ්‍යක්ෂ විසින් ගෙවිය හැකිය. විශ්‍රාම වැටුප එසේ ගෙවනු ලබන කල්හි විශ්‍රාම වැටුප ලබන පුද්ගලයා විසින්, වැන්දඹුවගේත්, ඇය මියයාමේදී මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇතිවිය හැකි ඇගේ දරුවකු හෝ දරුවන් ඇත්නම් ඔවුන්ගේත් නඩත්තුව, ආධාරය හා යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළ හැකි නියමයන් හා කොන්දේසි වලට අනුකූලව එම විශ්‍රාම වැටුප යෙදිවිය යුතුය.

(2) මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹුවක්, ඇය මියයාමේදී මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇතිවන දරුවකු අත්හල බවට හෝ අතරමං කල බවට හෝ ඇයගේ වත්කම් පමණින් ආධාර නොකළ බවට අධ්‍යක්ෂ සෑහීමට පත්වූ කල්හි අධ්‍යක්ෂ විසින් ඔහුගේ පරම අභිමතය මත වැන්දඹුවගේ විශ්‍රාම වැටුපෙන් සුදුසු යැයි සිතන කොටසක්, එම දරුවාට හෝ එම දරුවා වෙනුවෙන් සුදුසු වූද, යෝග්‍යවූද පුද්ගලයකුට හෝ ගෙවිය හැකි අතර, ඊට පසු එසේ ගෙවනු ලැබූ කිසියම් විශ්‍රාම වැටුප් කොටසක් සම්බන්ධයෙන් වැන්දඹුවට කිසිම හිමිකමක් නොතිබිය යුතුය.

(3) මෙම නියෝගයේ (2) වැනි ඡේදය යටතේ වැන්දඹුවකගේ විශ්‍රාම වැටුපෙන් යම්කිසි කොටසක්, වැන්දඹුවගේ දරුවා වෙනුවෙන් යම්කිසි පුද්ගලයකුට ගෙවනු ලබන කල ඒ දරුවාගේ නඩත්තුව, ආධාරය හෝ යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළ හැකි නියමයන් හා කොන්දේසිවලට අනුකූලව එම පුද්ගලයා විසින් එය යෙදවිය යුතුය.

(4) මෙම නියෝග යටතේ දරුවකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපක්, කෙලින්ම එම දරුවාහට හෝ භිලනාමයෙන් හැඳින්වෙන පදවියක් දරන්නකු හට හෝ අධ්‍යක්ෂක විසින් මෙම කාර්යය සඳහා පත් කරනු ලැබිය හැකි වෙනත් පුද්ගලයකු හට හෝ ගෙවිය හැකිවේ. එපරිදි පත්කරනු ලබන පුද්ගලයකු හට එම විශ්‍රාම වැටුප ගෙවනු ලබන කල, ඒ දරුවාගේ නඩත්තුව, ආධාරය හෝ යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළහැකි නියමයන් හා කොන්දේසිවලට අනුව එම පුද්ගලයා විසින් එය යෙදවිය යුතුය.

30. අනාත්දරුවන් සඳහා ගෙවිය හැකි විශ්‍රාම වැටුප් ගෙවීම නතර කළ යුත්තේ, පිරිමි දරුවකු සඳහා නම්, වයස අවුරුදු 21 සම්පූර්ණ කළ විට වන අතර ගැහැණු දරුවකු සඳහා නම් විවාහ වීමේදී හෝ වයස අවුරුදු 21 සම්පූර්ණ කළ විට යන දෙකින් කවර අවස්ථාවක් කලින් ඇති වන්නේද එවිටය.

31. (1) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදාගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ විවාහක දායකයකු විසින්, ඔහු සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයෙකු වීම අවසන් වීමට පෙර, දරුකමට හදාගත් දරුවකු, මෙම නියෝග වල (2) වැනි හා (3) වැනි ඡේදයේ නියම කරන ලද විධිවිධානයන්ට යටත්ව, දරුකමට හදාගනු ලැබූ තැනැත්තාගේ දරුවකු ලෙස සැළකිය යුතු අතර, ඒ අනුව, එබඳු දරුවෙකුට මෙම නියෝග යටතේ එබඳු දායකයකුගේ දරුවකුට මෙන් ඒ අන්දමෙම හා ඒ හා සමාන ප්‍රමාණයෙම විශ්‍රාම වැටුපකට හිමිකම ඇතිවිය යුතුය.

(2) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදාගැනීම සම්බන්ධයෙන්වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ විවාහක දායකයකු විසින්, ඔහු සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකුවීම අවසන්වීමට පෙර, දෙදෙනකු හෝ ඊට වැඩි දරුවන් ගණනක් හදාගනු ලබන කල්හි, එබඳු දරුවන් හට මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති නොවිය යුතුය, එනමුත් අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව, සාධාරණ හා යුක්තිසහගත වන විශ්‍රාම වැටුපක් එබඳු දරුවන් වෙත ප්‍රදානය කළ හැකිය.

(3) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදාගැනීම සම්බන්ධයෙන්වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ, දායකයකු වශයෙන් සිටින අතර විවාහක දායකයකු විසින් දරුකමට හදාගත් දරුවකුට, එම දරුවා දරුකමට හදාගැනීමට නත් දිනයෙන් පසු එක අවුරුද්දක් ඇතුළත එබඳු දායකයා මියගියේ නම් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් හිමි නොවිය යුතුය, එනමුත්, අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව, සාධාරණ හා යුක්තිසහගත වන විශ්‍රාම වැටුපක් එබඳු දරුවකු හට ප්‍රදානය කළ හැකිය.

32. බිරින්දෑන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ඇතිව සිටීමට හිමිකම ඇති දායකයකු හැර, වෙනත් දායකයකුගේ විවාහය බලයලත් උසාවියක තීන්දු ප්‍රකාශයක් මගින් අවලංගු කළ කල්හි හෝ නිෂ්ප්‍රභා කළ කල්හි, මෙම නියෝගවල කාර්යයන් සඳහා ඔහු වැන්දඹු පුරුෂයෙකු ලෙස සැළකිය යුතුය.

33. (1) සේවයෙන් විශ්‍රාම ගැනීම, අස්කිරීම, ඉල්ලා අස්වීම, පහකිරීම හෝ වෙනයම් කරුණක් හේතුකොට ගෙන දායකයකු සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකු වීම නතරවන දිනදී අවිවාහකයෙකු වන කල්හි, විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවිය යුතු යම්කිසි මුදලක් වේනම් එය අඩුකර ඔහුගේ දායක මුදල් වර්ෂයකට සියයට 2½ක් බැගින්වූ වැල්පොලිය සමග ඔහුවෙත ආපසු ගෙවිය යුතුය.

(2) ඉහතකී පරිදි, ආපසු ගෙවීමක් කළ කල්හි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් ඔහුගේ අයිතිය නිම විය යුතු වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා ඔහුට කිසිම හිමිකමක් ඇති නොවිය යුතුය.

(3) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකු වශයෙන් සිටින කල අවිවාහකයකුගේ මරණය සිදුවුවහොත් මෙම නියෝගයේ (1) වන ඡේදයේ ඇති විධිවිධාන යටතේ ගෙවිය යුතු වන මුදල ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් හට ගෙවිය යුතුය.

(4) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකුව සිටීම නිමවීමෙන් පසුව එහෙත් මෙම නියෝගයේ (1) වන ඡේදයේ ඇති විධිවිධාන යටතේ කිසියම් මුදලක් ආපසු ලැබීමට පෙර අවිවාහකයකුව මරණයට පත්වන කල්හි, එසේ ආපසු ගෙවීමට ඇති මුදල ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් හට ගෙවිය යුතුය:

34. (1) සේවයෙන් විශ්‍රාම ගැනීම, අස්කිරීම, ඉල්ලා අස්වීම, පහකිරීම හෝ වෙනයම් කරුණක් හේතුකොටගෙන දායකයකු සන්නද්ධ බලසේනාවේ සාමාජිකයකු වීම නිමවන දින, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු වේනම්, ආපසු ගෙවිය හැකි ඔහුගේ දායක මුදල් මුළුමනින්ම, එම දායක මුදලට වර්ෂයකට සියයට 2½ ක් බැගින්වූ වැල් පොලියද සමග ඔහු වෙත ආපසු ගෙවිය යුතුය.

(2) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකයකු ලෙස සේවයේ යෙදී සිටින අතර මිය ගියහොත්, ආපසු ගෙවිය හැකි ඔහුගේ දායක මුදල් මුළුමනින්ම එම දායක මුදලට වර්ෂයකට සියයට 2½ක් බැගින්වූ වැල් පොලියද සමග ඔහුගේ සුජාත දරුවන් අතර සම කොටස් වලින් ගෙවිය යුතු අතර, එබඳු දරුවන් නොමැති කළ එය ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

(3) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු සාන්නද්ධ බලසේනාවන්හි යාපාතිකයකුව සිටිය නිසා [illegible] එනමුත්, මෙම නියෝගයේ (1) වන ඡේදය යටතේ ඔහුට හිමිකම ඇතිවී තිබෙන මුදල් කිසිවක් ආපසු ලබන්ට පෙර, [illegible] ආපසු වන මුදල් ප්‍රමාණය සම කොටස් වලින් ඔහුගේ පුජාත දරුවන් හට ගෙවිය යුතුවන අතර, එබඳු දරුවන් නොමැති කල ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයා ගෙවිය යුතුය.

(4) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු සම්බන්ධයෙන් වන "ආපසු ගෙවිය හැකි දායක මුදල" යන යෙදුමෙන් අදහස් කරනු ලබන්නේ ඔහුගේ බිරිඳ හෝ බිරිඳන් ගෙන් අන්තිමයා මරණයට පත්වූ දින හෝ ඔහුගේ දරුවන්ට හෝ වයසින් බාලම දරුවාට විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම නැතිවූ දින යන මින් කවර දිනයක් පසුව වන්නේද එදිනට පසුව මෙම නියෝගයන් යටතේ ඔහුගේ වැටුපෙන් අවුරුද්දකට සියයට [illegible] බැගින් වන ප්‍රමාණයට ඔහු ගෙවා ඇති දායක මුදල් වේ.

35. (1) විශ්‍රාමික දායකයකු දුබලතා හේතුවක් නිසා හැරුනු විට වෙනත් කිසියම් හේතුවක් උඩ සන්නද්ධ සේවාවන්හි සාමාජිකයකුව සිටිය නිසා කලකිරීමෙන් විශ්‍රාම වැටුපක් ලැබීමට ඔහු සුදුසු නොවූවහොත් මෙම නියෝගයන් යටතේ ඔහු විසින් ගෙවා ඇති දායක මුදල් පොලියක් නොමැතිව ඔහුට ආපසු ගෙවිය යුතුය. තවද, එබඳු පුද්ගලයකුටද ඔහු වෙනුවෙන් හෝ ඔහු යටතේ හිමිකම් ඉල්ලා සිටින සියලුම පුද්ගලයින්ටද විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් දයිතිය අහිමිවන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ කිසිම ගෙවීමක් සඳහා කිසියම් විධියක හෝ හිමිකමක් ඔවුනට අයත් නොවිය යුතුය.

(2) මෙම නියෝගයේ (1) වැනි ඡේදයේ විධිවිධාන යටතේ පුද්ගලයකුට හිමිවී ඇති දායක මුදල් ආපසු ලබාගැනීමට පෙර ඔහු මියයන කල්හි, ඇතුළත ගෙවන එම මුදල, පහත දැක්වෙන පරිදි ගෙවිය යුතුය:—

එම මුදලෙන් එක් භාගයක් ඔහුගේ වැන්දඹුවටද අනික් භාගය, සම කොටස් වලින් යුක්තව ඔහුගේ පුජාත දරුවන්ටද ගෙවිය යුතුය.

දායකයාගේ යම්කිසි නීත්‍යානුකූල දරුවෙකු ඔහුට දාව උපන් දරුවන් සිටියදී දායකයා මියයෑමට පෙර මිය ගියහොත්, එබඳු දරුවාගේ පතු කොටස සම කොටස් වලින් යුක්තව මියගිය එම දරුවාගේ දරුවන්ට ගෙවිය යුතුය. වැන්දඹුවක හෝ නීත්‍යානුකූල දරුවන් නොසිටියදී දායකයා මිය ගිය හොත් ආපසු ගෙවනු ලබන මුදල් මුළුමනින්ම, අවස්ථාවෝචිත පරිදි, එබඳු වැන්දඹුවට හෝ දරුවන්ට ගෙවිය යුතුය. වැන්දඹුවක් හෝ දරුවන් නොමැතිව දායකයා මියගිය හොත්, ආපසු ගෙවනු ලබන මුදල් ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයාට හෝ උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

36. මෙම නියෝග යටතේ දායකයකුගෙන් හෝ මියගිය දායකයකුගෙන් [illegible] මෙම නියෝග යටතේ දායකයකුගේ වැන්දඹුවගෙන් හෝ දරුවාගෙන් [illegible] එබඳු වැන්දඹුවට හෝ දරුවාට හෝ වැන්දඹුව වෙනුවෙන් හෝ දරුවා වෙනුවෙන් හෝ ගෙවිය යුතු යම්කිසි විශ්‍රාම වැටුපකින් එය අඩුකර ගත හැකිය.

37. මෙම නියෝග වල අර්ථනිරූපනය ඇතුළුව, යම් පුද්ගලයෙකු දායකයකුද යන්න සම්බන්ධයෙන් හෝ, දායකයකුගේ වැන්දඹුවක් වශයෙන් යම් කිසි පුද්ගලයකුට යම්කිසි විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත්තේද යන්න සම්බන්ධයෙන් හෝ, යම්කිසි වැන්දඹුවකට හෝ දරුවෙකුට ලැබිය හැකි විශ්‍රාම වැටුප් මුදල සම්බන්ධයෙන් හෝ, මෙම නියෝගවල යම්කිසි විධිවිධානයකට දියයුතු අර්ථය හෝ අර්ථ නිරූපනය සම්බන්ධයෙන් හෝ යම්කිසි ප්‍රශ්නයක් පැනනැඟුන හොත් එය, යුද්ධ හමුදාපති විසින් ඔහුගේ මූලිකත්වය උඩ හා එබඳු දායකයකුගේ හෝ වැන්දඹුවකගේ හෝ [illegible] ලිඛිත ඉල්ලීම අනුව එවැනි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා, අධ්‍යක්ෂ මගින් රාජ්‍ය පරිපාලනය, පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලනය, පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ස්ථිර ලේකම්ගේ තීරණය අවසාන තීරණය විය යුතුය.

11-816

# වර්ග දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය—අංක 61/9/408

ආදායම් ක්‍රියාපටිපාටි ආඥාපනත (280 වෙනි අධිකාරය) යටතේ අංක 13,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1962 මැයි මස 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1970 නොවැම්බර් මස 16 වැනි දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඔහාස් වර්ගයක සඳහා අපනයන තීරු ගාස්තු පහත දැක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

රබර්

| | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම රාත්තලකට | — 0 98 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව රාත්තලකට ... ... ... | — 0 03 |

ඒ. ඊ. [illegible],
ප්‍රධාන රේගු අයකැ[illegible]

අංක ඒ. 701,
1970 නොවැම්බර් මස 15 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

11-836

## රේගු දැන්වීම—අංක 67/3/156

1967 නොවැම්බර් මස 22 වැනි දින අංක 14,775/17 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1968.2.22 වැනි දින නියෝජිත මණ්ඩලය විසින් සම්මත කරගත්, 1963 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙනා ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, නොවැම්බර් මස 16 වැනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිස්සයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රත්තරන් හා සැසඳු ඇතුළත් වටිනාකම ටොන් එකක් රුපියල් 1,303.24 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙන්නනා පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අඹු පොල්ගෙඩි 1,000 ක් අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 452 00 | ... | 547 62 | ... | 405 05 | — | 113 00 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ඒ. ඊ. [illegible]
ප්‍රධාන රේගු අයකැමි [illegible]

අංක ඒ. 744/22,
1970 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදීය.

11-835

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.